# ලන්ඩන් කවි
# LONDON KAVI

2 Queens Parade Green Lanes LONDON N. 8 ORD
Tel: 02083476151, Fax: 020-83480660, Email: londonkavi @ annra net Free Circulation - Vol 1 Issue 1 September/October 2003

## මගේ රට

පෙරදිග ලෝකයේ බබළන මුතු ඇ    ටය
පණ ඇති මහා සමුදුර පවුරෙන් ව    ටය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණ ර    ටය
ලොව අන් සියලු දිවයින් මේකට ය    ටය

මහවැලි - කැළණි - වලවේ - කළු යන    ගංගා
සමනළ කන්ද මුදුනේ සිට පැන    නැංගා
බැවුම් තැනිතලා හෙල් අතරින්    රිංගා
මේවා ගලයි මිණි කැට දිය යට    හංගා

උණුසුම සිසිල සහ අතරෙහි සම ගු    ණය
ඇති අන් රටක් නැත, මගෙ රට ඇති තැ    නය
මුව, මී, ගෝණ, ඇත් සේනා යුතු ව    නය
පවසන්නේය මට ඇති ජාතික ද    නය

අගනා දුබල වනමල් ගොමු ඇත බැ    ද්දේ
තුරු මත කුරුල්ලන් ගේ සුමිහිරි ස    ද්දේ
මීදුම් පටල පෙර වූ නිල් කඳු මැ    ද්දේ
සීතල රිදී දියවැල් පහළට ඇ    ද්දේ

තෝපා, තඹලගම, මිණිපේ, මින්නේ    රි
මහ වැව්වලින් දියවැල් ඇදෙමින් බේ    රි
සරු කරවයි කුඹුරු නිල් පැහැයෙන් මේ    රි
මගෙ ලක් මැණියන් ඈ හරි පින් කා    රි

අඹ, දඹ, පේර, වැල, වරකා, අන්නා    සි
රඹුටන්, දිවුල්, බෙලි, මොර තුරු අග රා    සි
පලතුරු ඉදී සුවඳින් අමරස පෑ    සි
ගෙන දෙන්නේය මගෙ ලක්මව වෙත ආ    සි

අව්කණ - ගල් වෙහෙර ඇත මහ පිළිම තැ    ණූ
සුකිරි වගෙයි පුත්තලමෙ මිදුණු ලු    ණූ
සීගිරි ගලේ සිතුවම් ලොව පුදුම වු    ණූ
ආඩම්බරයි ලෝවා මහ පහයෙ ක    ණූ

නටබුන් නගර අනුරාපුර පොළොන්    නරු
පේරාදෙණිය, හග්ගල මල් උයන්    සරු
දුම්හිඳ වගේ මහ ඇලි දිය කඳින්    පිරු
මැද මහනුවර දළදා හිමි සඳුන්    ගරු

හරියට නියම කාලය තුළ වහින වැ    සි
නව තඹ පාට වැල්ලක් හැම තැන ම දි    සි
දිවයින මගේ මුළු ලෝකය කරන ව    සි
දණ බිම ඔබා නිතර ම නැමදුමට නි    සි

**පී. බී. අල්විස් පෙරේරා - 1947**

## සුවඳ තියා මා ළඟ..........



මල් මල් සිනහවක් එන්නට රැජින    හට
කල් යල් බලා දුන්නත් මල් පොකුර    මිට
දෙල් වූ බව කියයි ඇඳ වූ කොමළ    කට
වල් මල් නෙළා දෙනව ද රැජිනියක    හට

ගව් දස දහස් ඈතින් විසුවත් මැකේ ද කවි සෙනෙහස    සැමඳා
හැබැහින් සිහිනෙන් සිතමින් ලක්බිම යන එන දිවි ගෙවනා    සුහඳා
මල් වරුවාණෙනි නෙළනු මැනවි කවි නෙළුම් විලේ සිතුවිලි    පාඳා
ලන්ඩන් කවි පිටු සරසමු සැඳැසින් නිසැඳැසියෙන් සිතුවිලි    විහිඳා

## සිංහල කාව්‍ය වංශයෙන් කවි කිහිපයක් හෝ නොදන්නා තැනැත්තා සිංහලයෙක් නම් නොවේ.

අපේ පැරැන්නන් ශිලා ලිපි ලිව්වේත් කවියෙනි. ඒ, ඔවුන් කවියට දැක්වූ ඇල්ම යි. කිසියම් විහාරයක් ආරාමයක් කරවූ රජවරු ඒවා සංඝයා වහන්සේ වෙත පූජා කොට ගී විරිතින් ලියූ කවියක් ගලක කොටවා තැබූහ. අකුරු ශාස්ත්‍රය නො දත් ගැමියා සිය මහන්සියටත් කාන්සියටත් කළේ කවි කීම යි. රාත්‍රිය පුරා වෙලේ පැලේ කවි ගැයිණ. කරත්ත නඩයේ ගොනුන් ගෙල බැඳි කිංකිණි නාදයට ගැල්කරුවන්ගේ කවි නාදය මුසු විය. මවු උකුළෙහි දරුවන් නැළවුණේ මවගේ නැළවිලි ගී අසමිනි. ලංකාවට පැමිණි දේශාටකයන් පැවසුවේ හැම සිංහල මිනිසා ම එක්තරා ආකාරයක කවියකු බව යි. කවිය සහ සිංහල මිනිසුන් අතර ඇත්තේ අත්‍යන්ත බැඳීමකි. කවිය අපේ උරුමය යි. අපගේ සම් මස් ලේ නහර තුළ නිදන් ගත ව ඇති කවිය ඕනෑම මොහොතක පුබුදු ව අප චමත්කාරයට පත් කරන්නේ ය. අවුරුදු දහස් ගණනක අඛණ්ඩ ඉතිහාසයක් ඇති සිංහල කාව්‍ය වංශයෙන් කවි කිහිපයක් හෝ නො දන්නා තැනැත්තා සිංහලයෙක් නම් නොවේ.

□ මහාචාර්ය සුනිල් ආරියරත්න

### රාත්‍රියේ ස්වප්නය

තවු සලා ඉගිලෙන්න එපා තරු රාත්‍රිය
බොල් පිණි; ඉහිරෙන්න මිහිමඬල ඉතිරෙන්න
අඳුර කළු රකුසු නුබ ලය ඉරා නොදමන්න
සඳ එළිය යන්තමින් අතු පතර නැහැවෙන්න;

මල් වනේ මල් පොකුරු සුවඳ විහිදී යන්න
සීත සුළඟක් ඇවිත් ගිනි ලයට පිඹපන්න
මේ අඳුරු පාලුවට තාරකාවක් වන්න,
සිහින් හඬකින් ලයට ගීතයක් මුමුණන්න;

සා මුවන් පැටවුනේ සීතලට ගුලිවෙන්න
පුංචි කිරි දරුවනේ සෙනෙහසට යාවෙන්න
නිදිකිරන සෙනෙහසට සඳ එළිය නෑවෙන්න
ජීවිතය පාළුවට සිහිනයක් ළංවෙන්න.

□ ශ්‍යාමලී ගුණතිලක
ලන්ඩන් N11 AN

**Editor** - Anura Hegoda
සංස්කාරක - අනුර හැගොඩ
**Editorial Assistance** - Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuththara
සංස්කරණ සහය - යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
Web Design - Kasun Palansuriaya
වෙබ් අඩවි නිපැයුම - කසුන් පලන්සූරිය

### වැඩ කෙරුවනම් ලංකාවෙදි මේ ලෙසට

ලන්ඩනයට ඇවිත් අවුරුද්දක්     වෙනවා
මා ප්‍රිය බිරිඳ හා දරුවන් සිහි     වෙනවා
මොනවා කරන්නද බැඳි ගැල ගෙන     යනවා
කහවනු සොයන්නට මම මෙහෙ     වෙහෙසෙනවා

සුරපුරයක් ලෙසින් ලන්ඩන් ගැන     සිතුවේ
සුරසැප විඳින අය දැකගන්නයි     පැතුවේ
ඒ සුරපුරය හැබැහින් නම් නැහැ     දුටුවේ
පවුමේ පදයටයි මෙහෙ හැමදෙන     නැටුවේ

රැය එක තැනක දහවල වැඩ තව     තැනක
සති අන්තයේ වැඩ කරනව වෙන     තැනෙක
පවුමෙන් පවුම මිටි බැඳිනව     හනි හනික
මේවා අරන් අපි යනවද යන     තැනෙක

වැඩ කෙරුව නම් ලංකාවෙදි මේ     ලෙසට
අපෙ රට අද ගිහින් ගවු ගණනක්     උඩට
අද බැරි නම් හැකි යම් දිනයක     ඔබට
ඔබෙ යුතුකම කරනු ඔබ ඉපදුණු     රටට

□ එච්. අතුල පෙරේරා
ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය
ලන්ඩන්.

---

### මනා නිවහන

මා පෙම් කළ ළඳ
රුවින්
ගුණෙන් යුතු
චරිත ලතා

යස ඉසුරින්පිරි
ඇගේ විමානය
සමුදුර නිම්තෙර
කෙළවර මායිම

"පියඹා! පියඹා!
එන්න කුමරුනී"
ගුවණින් පාවී
සවනට කොඳුරන
ඇගෙ හඬ
ලයාන්විතයි.

*     *     *

දුරු රට කතරක
මා හැර නොයන් පුත
මහලු විය! තනිකම
විඳින්නට බැරිම තැන

මවුගුණය යහමින්
තිළිණ කළ මා වෙත
ගෙදර බුදුන් මගෙ
එවදන් හඬවා
හදවත පාරයි
ළය කම්පා කරවයි

*     *     *

අප තිදෙනාට ම
මනා නිවහනක්
සොයා වෙහෙසුණෙමි
මම.

හමුවේවි සහනය
කළයුතුය තරණය
සංසාර
සාගරය!

□ සුමනා අදිකාරි
එන්ෆීල්ඩ්
මිඩ්ල්සෙක්ස්

## තාත්තා

පරණ මතකය දිගේ ඇවිද
හෙමින් වෙල් නියර උඩට වී
නිමක් නොපෙනෙනා අහස යට
නිලන නිල් ගොයමට
සුසුම් එක් කරයි තාත්තා

ගුරු පාර හඳුනන පියවර
කළු තාර නාගයෙකි
කොහිද වන පෙත් ලඳු කැලෑ
විදුලි පහන් ගස්වලට
ඉඩ දී ගොසින්

රබර් පිහියා - කිරි බාල්දි
කර තබාගත් පෙරහර ද නැත
යැංකි කලිසම් ටී ෂර්ට්
පරපුර දෙස
විස්මයෙන් බලයි තාත්තා

කිරුළ නැති හිසට
පුරා වෙසතුරු සිරිතට
දන් දී සියලු සම්පත්
ඇවිද යන පැරණි විජිතයේ
නිනව් නැති රෑ දවල්
කල්පනා සොරු ගෙන ගිහින්

නොබිඳ අබිමන්
හිනැහෙයි එහෙත් පුරුදු සීදේවි මුහුණින්
ජීවිතය තුළ තාත්තා

□ ගාමිණී සුමනසේකර



## පූජ්‍ය ගලයාලේ පියදස්සි හිමි

පූජ්‍ය ගලයාලේ පියදස්සි හිමි විසින් කරන ලද සමාජමය සත්කාර්යයන් හේතු කොටගෙන මහ රැජින විසින් M.B.E. ගෞරව නාමයක් පිරිනැමීම නිමිත්තෙනි. ඒ පිළිබඳ උපහාර උළෙල සැප්තැම්බර් 26 වෙනි සිකුරාදා සවස 6.30ට ලන්ඩනයේ බ්‍රෙන්ට් නගර ශාලාවේදී පැවැත්වේ.

පියදස් හිමි නමට ජනතා බලය පිරී
දහස් ගණන් දන බලමැන පුදන සිරි
සැමට ම ලන්ඩනයෙ සදහම් සුවය පිරී
ලොවට ම සමිඳ පෙන්වයි බුදු දහම් සිරි

වරකා ජම්බු ගස්ලබු අලිගැට පේර
මෙහි නොතිබුණත් පිනවන්නට රස නහර
නෙත ගැටුමෙන් සමිඳු සැදූ කිංස්බරි වෙහෙර
අපටත් දැනෙනවා නිවනෙහි අම මිහිර

පියදස් හිමි කරන වැඩ දස මහා යෝද
රැජින ද පුද කළේ පැහැදීමෙන් නේද
සුදු මිනිසුන් පවා දෙයි ජය ධජ නාද
ආඩම්බර ඉතින් අප හැමට ම නේද

සුරංග

## කපුගේ

කල්ලඩි පාලම අද්දර සිංදු කිවුව මාලුවෝ
පුංචි කාලේ ඉඳලම අපි යාලුවෝ මාලුවෝ
පාලම අද්දරට එන්නෙ ගී අහන්න මාලුවෝ
ගොලුවී නිහඬව ඉන්නේ කොහොමද මගෙ මාලුවෝ

මරණ බියෙන් ගැහෙන හදට ඔබ ජීවිත හුස්ම දුන්න
අනුන්ගෙ ජීවය රකින්න ඔබ ලේ මස් පිනට දුන්න
කඳුළු උනන ඔබගෙ දෙඇස් කරුණාවෙන් බලා උන්න
ලෙන්ගතු ඔබ ආදරේට ජීවිතේම දැයට දුන්න

සටන් වැදුණ, ඇදන් වැටුණ යළි නැගිටල සෙටන් වැදුන
උඩින් උඩින් යන පෙත්තල හොයල හොයල පහර දුන්න
සිහින් සියුම් රාගතාල ඒ අස්සෙන් අපට දුන්න
අනුන් දුකෙන් මුදවන්නට අබිමන් උකසටත් දුන්න

මැර තර්ජන වැඩ වර්ජන වැඩ තහනම අඩුවක් නැහැ
ටොරින්ටරේ මහ ගෙදරට පයක් ගහන්නට දුන්නෑ
ඉදකඩ ළඟ මාරගහේ හෙවෙනදි දුන් හඬ අද නැහැ
කපුගෙ ඔබව නොමැරු මැරූ උන්ගැන ඔබෙ අහිතක් නැහැ

ලීලානි පෙරේරා
ලන්ඩන් E 12

## HOT OR COLD

*Whether the weather is hot or*
*whether the weather is cold*
*I don't care 'cause my dad's head bald*
*and he just caught a cold!*
*Whether the weather is cold or*
*whether the weather is Hot*
*I do care 'cause I just drew a dot*
*and I hope it means a LOT!!*

□ **By Vinuri perera**
**Class: 5H, Stag Lane Middle School.**

## දියණියට උපන් දින සුබ පැතුම්

දරා ගෙන කුස බිලිඳු සුවයක අපරිමිත සෙනෙහසැති සුවඳක්
විඳිනු වස් මඟ බලා හිඳිනා දියණියේ සුබ උපන් දිනයක්!
සඳක් වැනි වූ මලක් වැනි වූ ලබා ගෙන දරු සම්පතක්
යෙහෙන් වැජඹෙනු සැප සුවය මැද සදා විඳිමින් සොම්නසක්!

□ කුසුමා මුදියන්සේ - ලන්ඩන් NW 2

## සමරමි මවුගුණ

අසුවිය සපිරුණ
මෑණියෙනි ඔබේ ගුණ
සැමරුමට ලද වරම
යොදාගමි මෙලෙස මම

ඔබේ මවු ගුණ වැයුම
පහසු නැත කිසි විටෙක
මෙනෙහි කළ විට මෙමට
මතක් විය බොහෝදෙය

දරු සතර දෙනෙකුටහට
දයාබර මවක විය
තවත් බොහො දෙනෙකුහට
දෙවෙනි මවු කෙනෙකු විය

ගුරු මෑණියක ලෙස
රටට කළ සේවයට
උපහාර ලද බවට
සනිටුහන් කරමි මම

ඔබේ එඩිතර ගතිය
දැහැමි මෙත් කුළුණු බව
සැලසුම් සහිත බව
අගය කරනෙමි සදා කල්හිම

බාල දියණිය ලෙසට
උණුසුම ඔබෙන් ලැබුමට
උරුම විය කළෙකට
තාම මතකයි එය මෙමාහට

දුරක සිටියද මෙමා
මෑණියෙනි ඔබෙ දෙපා
වඳිමි නිරතුරු සිතින්
හදේ පිපි බැති මලින්

ඔබෙ දිවියෙ සැඳෑකල
සතුටු සිතුවිලි අතර
ගෙවන්නට පතමි මම
දිගු කලක් ආයු විඳ

□ ජයන්ති ගුණසේකර
ලන්ඩන් N 12

## හිනැහෙමි

හිරුට හොරා සඳ නැඟ එන විටදි අමවතේ
නෙතට හොරා කඳුළු බිංදු වැටෙන විලාසේ
ගසට හොරා මල් පීදී වැනෙන කාලයේ
සිතට හොරා හොඬ සිතක් දැනේ ආදරේ

සයුරු තෙරේ හාවෙන්නට සුනිල දිය ඇදේ
මුවග පුරා සිනා පුරන සඳේ හරි අගේ
සෙනෙහෙ පුරා මල් පොපියා සඳේ කැළුම් අහසපුරා
හිනැහි හිනැහි තරු හායයි මේ රෑ යාමේ

මලින් මලට පියඹනු බෑ සුවඳ නොම දැනේ
එකම මලක තොල් පෙති මත තබමි ආදරේ
අඳුර ඉරා එළිය පිබිද පුබුදු කළා මා දෙනයන
හිනැහෙන්නට වරම් දුන්න මගේ ආදරේ

□ සපුමල් බණ්ඩාර
ලන්ඩන් N 22

## හමුවීම

| | |
|---|---|
| ඊයක් විද හළෙමි මම ඉමහත් | වැරෙනි |
| වේගෙන් එය ගියේ නිල් අහසේ | නොපෙනී |
| ඊයට කුමක් වීදැයි දුන්නද | නොදනී |
| කවුරුන් දනීවිද යළි නොම එන | බැවිනී |
| | |
| ගීයක් පිඹ හළෙමි මම උරුවම් | හඬිනී |
| මුසුවී වා තලේ එය සවනින් | මැකුණි |
| කොහි වෙද ගිය තොරතුරු දැනගනු | රිසිනී |
| කවුරුන් සවත් වෙද මගෙ සිත නම් | නොදනී |
| | |
| බොහො කලකට පසුව වන පෙදෙසක | රමණී |
| හමුවිය ඊතලය තුරු කඳකට | ඇමිණී |
| ම එදා ගැයූ ගීය නවඅරුතක් | දෙමිනී |
| මිතුරෙකු මුමුණමින් මඟ යනවා | ඇසුනී |

□ දයා ආනන්ද රණසිංහ

## සුභාෂිතයෙන්

| | | | |
|---|---|---|---|
| නැ ගෙ න | ත් | අවර ගිරගින් දිනකර | මඬල |
| පි පෙ ත | ත් | ගිරි මුඳුන සෙල්වලැ | පියුම'පුල |
| සැ ලෙ ත | ත් | සුනෙර අනලින් ලැබෙතත් | සිසිල |
| බොරුනැ | ත් | නෙමැයැ මහතුන් පැවසූ | තෙපුල |

**අවරගිරෙන් සූර්ය මණ්ඩලය උදා වුව ද, ගිරි මුදුන්හි ගල්වළෙහි නෙළුම්, මානෙල්, පිපුණ ද, මහාමේරු පර්වතය සුළඟින් සැළුණේ වුව ද, ගින්නෙන් සිසිල ලැබුණේ වුව ද, මහත්මයන් කියූ වචනෙහි අසත්‍ය නැත්තේම ය.**

## නලා හඬ

සයිරන් හඬ
නගරය අවදි කරයි
කළඹයි
එළිවන තුරු
රෑ වන තුරු
ගිලන් රිය, පොලිස් රිය,
ගිනි නිවන රිය
රෑ මැදියම
ඊරි යකා දෝ
මහසෝනා දෝ

දෙරණත කම්පා කරමින්
බිහිසුණු හූ හඬ නගමින්
නින්ද බිඳී උඩ විසි වී
පුර වැසියෝ පෙරළෙති
යහනින් බිමට
හූ කියමින්
පියඹා යන
පොලිස් රියේ
හූ හඬින්

නින්ද කැඩී
වෙව්ලමින්
මම සිතමි

මේ වේගය
මේ ශක්තිය
ලැබේ නම්
මොහොතකට
මටත්

සත් සමුදුර තරණය කොට
පියඹා
යන්නෙමි
හන්තාන අඩවියේ
මගේ
නිහඬ ගුහාවට

□ උදය ප්‍රශාන්ත මැද්දේගම
ලන්ඩන් සරසවිය.

# මොණිකාගෙන් විවරණ කවක්

**මොණිකා රුවන්පතිරණ නූතන කාව්‍ය වංශයේ මුල් පුටුවක් හොබවන කිවිඳියකි. ඇගේ නවතම කාව්‍ය සංග්‍රහය වන 'හිපොක්‍රටීස් සහ රෝගිනී' පිළිබඳ ව පරාක්‍රම කොඩිතුවක්කු කවියා ගේ විමසීමයි.**

කෝට්ටේ යුගයෙහි කවියේ මල් පිපීමක් හටගත්තේ එතෙක් ප්‍රබල ව ද දුබල ව ද පැවත ආ නන්විධ කාව්‍ය මාර්ග රීතීන් හා පද්‍ය විලාසයන් ගේ අන්තර් සහවාසයක් නිපදවාගැනීමට එම හෝරාව තුළ වූ සමාජ හැකියාව නිසයි. එහි දී සිංහල කවියේ පරිපථයට නව ආලෝකය සඳහා ශක්තිය ලැබදී ඇත්තේ පණ්ඩිතමානී ව්‍යාජ මහා සම්ප්‍රදාය නො ව පොදු ජනකාය ඇසුරින් නිපැදවුණු ජීවිත පහසින් යුත් සැබෑ මහා සම්ප්‍රදාය වූ ජනකාව්‍ය මාර්ගය බව අන්තර් ඥානයෙන් කාව්‍ය ඉතිහාසය දකින්නකුට පෙනී යන යථාර්ථයයි. මෑතක දී දකුණු ආසියාතික කවීන් ගේ කාව්‍ය සංග්‍රහයක් සම්පාදනය කළ අශෝක් ව-පායි නම් ප්‍රකට ඉන්දීය කවියා මෙසේ පවසනවා.

"...තෙවැනි ලොව සාහිත්‍යයේ සිදුවූ විශාලතම ප්‍රජාතන්ත්‍රීය ව්‍යාපෘතිය වන්නේ සාමාන්‍ය මිනිහා ඔහු ගේ සාමාන්‍ය ජීවිත සිද්ධිය සාහිත්‍ය කලාවේ මැද්දට ගෙන ඒමයි. සාමාන්‍ය මිනිසා ගේ එදිනෙදා ජීවන නාටකය වැඩි ආලෝකයකින් දාර්ශනික ව සිතුවම් කරන්නේ කොහොම ද කියන එකයි අද ආසියානු කවියා හමුවේ ඇති අභියෝගය.

සිංහල කවියා මේ නූතන අභියෝගය ජය ගන්නා ප්‍රෞඪ අවස්ථාවක් මොනිකා රුවන් පතිරණ ගේ නවතම කාව්‍යය 'හිපොක්‍රටීස් සහ රෝගිනිය' සේකර ගෙන් පසු ව අදීන ව නව මං ගනිමින් ප්‍රතිනිර්මාණාත්මක ව එබඳු අභියෝගයන් භාරගත් අවස්ථා හැටියට අප ඈසට පෙනීයන්නේ නන්දන වීරසිංහ ගේ 'මම සත්‍යකාම වෙමි' සීතා රංජනී ගේ 'තිත්ත කවියට පෙරවදනක්' හා සුනන්ද මහේන්ද්‍ර ගේ 'ජීවක වත' යන ආඛ්‍යාන කාව්‍යයන්. (ආරියවංශ බුද්ධි හා හැගොඩ ගේ කව්වල ද මෙම ආධ්‍යාත්මිකය රැඳී ඇත.) මෑතක දී පළ වූ රියෙන්සි කෘෘස් ගේ 'සර්දියෙල් ඉංග්‍රීසි දිගු කව ද එවැන්නක්. ඔබෙ යෙහෙළිය ඇය ගැහැනිය - අසන් පත්තිනි දේවතාවී යන ධාරී කාව්‍යයන් ප්‍රබන්ධ කළ මොනිකා ගේ මෙම නව විවරණ කව සිංහල කවියට හා රසික සමාජයට ලැබ දුන් ගම්භීර ප්‍රදානයක් වන්නා සේ ම මොනිකා රුවන්පතිරණ ගේ පන්තිස් වසරක කාව්‍යකරණයේ අග්‍රඵලය ලෙස ද හැඳින්වීම සහේතුක බව එහි පාඨකයා පිළිගනු ඇත.

'ජීවිතය මට මෑත කාලය තුළ බොහෝ අත්දැකීම් ලබා දී ඇත. නිර්මාණකරුවෙකු ගේ ජීවිතයේ දිශාව වෙනස්වීම නිර්මාණයේ ද දිශාව වෙනස්වීමකි. කවිය යනු ජීවිතය ම මිස අන් කුමක් ද? (පෙරවදන) දිවි මගෙහි උස් මුදුනක දී සැඩ සුළඟකට හසු ව කිවිඳිය අත්විඳි දරුණු සොඳුක් පුවතම ඇගේ කවියේ සමරූපී පෞරාණිකත්වය පුපුරුවාගෙන හැලි ගසා දිවෙන හොයක් සේ නව ධාරිතාවකින් නව ලකුණින් සමලංකෘත කාව්‍ය ඵලයක් බිහිකර ඇත්තා සේ ය! විශිෂ්ට සාහිත්‍ය කෘතියකට තථ්‍ය සංකීර්ණත්වයක් නව ගැඹුරක් හිමිවන්නේ එය නිර්මාණකරු ගේ ජීවිත තටාකය තුළින් උණු ව පෙරී එන විටයි.

'හිපොක්‍රටීස් සහ රෝගිනිය' ප්‍රබල සංකීර්ණත්වයක් ලැබීමට මුඛ්‍ය හේතුවක් වන්නේ මොනිකා රුවන්පතිරණ තම කාව්‍යයේ ප්‍රධාන භූමිකාව වූ රෝගිනියට බහුවිධ චරිතාරූඪයක් කිරීමට සමත් වීමයි. ලෙඩ ඇඳේ සිටින ගිලනිය වරින් වර විවිධ අවතාරවලින් කතා කරන්නා සේ ය. කිවිඳිය නිෂ්පුද්ගල වී සෙනඟ මැද මගේ මම හැඳුනුම අහෝසි වී යයි. ඇය කිවිලියක ලෙස කව් පදයක් කියනු අපට ඇසෙන්නේ එක් අවස්ථාවක පමණ ය. තේ කම්හලක කම්කරු ලිය කෝච්චි බස්වල තෙරපී වැඩට දුවන කන්තෝරුකාරිය, දෙකේ කොලනියේ රීටා රාසයියා ගේ පවුල, ඩුබායි සිට ආ පාතිමා, ගර්කින් බටානා වවන ගැහැනු, නිකං දෙන බත් මුල අරන් මැයි පෙළපාලි යන ස්ත්‍රිය මේ සියලු ස්ත්‍රී චරිතයන් කිවිඳිය ගේ ලෙඩ ඇඳෙහි හඬනු දොඩනු පිටුවෙන් පිටුව ඇසෙනවා. ඒ ඒ චරිතයන් සඳහා බහුවිධ කටහඬවල් (MANY VOICED) ලබා දීමට මොනිකා තම කව තුළ තනාගන්නා බහුභාෂීය මෝස්තරය (POLYPHONIC DESIGN) යි මේ ආඛ්‍යාන කාව්‍යය ජීවම් කර ඇත්තේ.

මෙසේ කිවිඳිය තම නිරූපණ පථය මැද්දට ගෙන එන්නේ තම පුද්ගල ආත්මය නො ව අප මැදි ව සිටින මෙම පොදු සමාජයේ පීඩිත මනුෂ්‍යත්වයයි. අතමිට නැති මේ පීඩිතයන් හැම එකකු ම ජීවිතය ම මිටින් අල්ලාගන්නට දරන්නේ යම යුද්ධයක් ය. පිළිකා වාට්ටුවේ සිවිලිමෙන් පහතට බසින රථයේ සිටින්නේ මාර දිව්‍ය පුත්‍රයා ය. එහෙත් මරු සමඟ යන්නට ඔවුන් ජීවන කිස සම්පූර්ණ කොට නැහැ. බොහෝ ජීවිත පටන්ගත් තැන්වල ම ය.

'බාගෙට හැදුණු ගේ දොර ණයතුරුස් දමා
යන්නට හැකි ද මට කිසිදා එබඳු ගමන්
ලොකු කොලුවා මේ වසරේ අන්තිමට
දොළහේ විභාගෙට ඉන්නයි සැරසෙන්නේ
දෙවැන්නාට හැදිලා මීමැස්මොරය
අනේ කෙලී ගෙට ගත්තා විතරක්ය
රථයට සාදු කිවුවා කඳුලක් වැටුණා
ඇස් වහ ගතිමි මම කිසිවක් නොදුටු ලෙසින්

සැත්කමට පෙර ගිලනියට සිතෙන්නේ පන්සිල් ගත්තාව ද කියා ය. පුණ්ණා හාමුදුරුවන් බාලේ දී කියා දුන් ගාතා ඇගේ සිතින් මතු වේ.

'ඒ වුණාට හිපොක්‍රටීස්
හාමුදුරුවො කියා දුන්න
හිතදාලා තබන් ඉන්න
මේ සරීර මඩිස්සලේ ලෙඩින් පිරුණ කූඩුවක්ලු

කාගෙන්දෝ ටික කලකට
කුලියට ගත්තා වගේලු
ලේ මුත්‍රා පර්යේෂණ
සිරුර වඩන මන මෝහන
මේ කිසිවක් කළේ නැති ය"

මරණ බයක් ඇද්ද සතුරන් සිටිනවා ද වෙදැදුරා විමසන්නේ රෝගයට මානසික පසුබිමක් ඇද්දැයි දැනගැනීමට ය. රියසක කුසලාකුසල විඥානය ගැන තම සිතැඟි පවසන රෝගිනිය ද වෙදැදුරියක සේ ය. බාලේ දී වෙද ගෙදරට ගිය ද ලොකු දෝතකට පුංචි දැත ගොනු කරගෙන කතා කළ ධර්මදාස වෙද මහතා ඔබ ද? බුදුන් හා සතා සරුපයා සුවපත් කළ ජීවකයන් බුද්ධදාස රජුන් ඔබ ද? රෝහලට ආ දවසේ සිට ම ගිලනිය වෙදැදුරු ගෙන් අසන පැනවලින් විද්‍යමාන වන්නේ ඇය උතුම් වෛද්‍යවරයා සොයන බවයි. අහස් ගැබ දෙවිවරුන් සාක්කි පිණිස බලා සිටිය දී ඔබ දුන් හිපොක්‍රටීස් දිවුරුම දැන් මතක දැයි ඇය වෙදැදුරු ගෙන් අසයි. සිය සැත්කමේ දී වැරදීමකින් හෝ කිසි යම් අවයවයක් මඟහැරුණා දැයි අසයි. කිසිවක් පහදා නොදී ට්‍රොලියෙන් ට්‍රොලියට යන්තරයෙන් යන්තරයට තල්ලු වන ඇය ට්‍රොලියෙන් බිමට පනී!

මට නොවෙදැයි ලෙඩ වැලඳී තිබෙන්නේ
මා ලෙඩා නොවන විදිහයි පෙනෙන්නේ

ස්කෑනරයේ විදුලි ඇඳේ සිටින ඇයට මරුවා ද සරදමක් මෙන් ය.

ඔන්චිලි චිලි චිලි චිල්ල මලේ
ස්කෑනරයේ විදුලි ඇඳේ
රන් විදුලිය ඔන්චිල්ලේ
අද පදින්නේ නැවතිල්ලේ

රංචාගොඩ ළමයා ගේ ස්වරයකින් කිවිඳිය මෙසේ ගිලන් ඇඳට ගෙන එන බහුවිධ චරිත හාස උපහාසාකාරයෙන් සිතුවම් කරන්නේ අධියථාර්ථ රීතියකින්. මට සිහිපත් වූයේ 'මයි ෆෙයාර් ලේඩි' නාටකයේ එන 'ඩූ ලිට්ල්' මල් වෙළෙන්දිය ගේ චරිත මෝස්තරයයි. මේ හාස උපහාසාකාරය චරිත නිරූපණයේ දී බලවත් රීතියකි. 'සිල්ලර මිනිසුන් ගේ ජීවන රිද්මය හා මනා ව සැසැඳෙන එබඳු රීතියක් නිපදවා ගැනීම කිවිඳිය ගේ දුර්ලභ පරිකල්පනා ශක්තියේ ඵලයක් බව කැපී පෙනෙයි.

මුල සිට ම මොනිකා ගේ කාව්‍යකරණය සම්ප්‍රදාය තුළ රැඳුනක්. මේ නිසා ඇගේ බොහෝ කවි 'පෞරාණික සමරූපතාවක් දැරූ බව මගේ හැඟීමයි. ඇය මන බැඳි සාම්ප්‍රදායික භාෂා ආකෘති රටා අනුව කවිපද බැඳීමේ ඇ සතු බන්ධ චාතුර්යය නම් අපූරුයි. මේ සම්ප්‍රදායී මුහුණුවරින් කියන්නට බැරි අත්දැකුම් පතිත වුව හොත් තමා නිදහස් රීතියට යාමට මැළි නොවන වග ඇය වරක් කීවා මතකයි. දැන් ඈ නිදහස් රීතියකට පළමු වරට පිවිසෙනවා. සමාජ ජීවියා වමනය කරන නව අත්දැකීම් කඳ මෙන් ම තමා විඳි දරුණු ජීව වේදනා කිවිඳියවත් ඇගේ කවියත් පුනර්භවයකට පත් කළා සේ ම ය. ඇය නිදහස් රීතිය භාවිත කරන්නේ ද සම්ප්‍රදාය තුළ ම ඇති අවකාශය පරෙස්සමෙන් විෂයානුගත ව ගන්නා තාක්ෂණික ශිල්පීයත්වයකින්. එහෙත් සම්මත මාත්‍රා බන්ධනවල ඒකාකාර රිද්ම නිසා මොනිකා ගේ අත්දැකීම්වල සූක්ෂමාත්මතාව ගිලිහී යන තැන් ද කාව්‍යාවසානයේ දී පෙනී යනවා.

**දිවයින ඉරිදා සංග්‍රමය ඇසුරිනි.**

පරාක්‍රම කොඩිතුවක්කු



මෙම පිළිරුව කරුණා බස්නායක මහතා විසින් නිර්මාණය කරන ලද්දකි.

## ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමනි

සිඟිති දරුව ද සොඳුරු බිරිඳ ද අතැර නික්මුණු සොයා නිදහස
එදා සිදුහත් කුමරු පියනැගු අයුරු නිවසෙන් පිටව ගිය ලෙස
අතැර ලව්කික සැපත නොවටින දමා පසෙකට කෙළ පිඬක් ලෙස
අනාගාරික වෙමින් දම්පල්, ගෙයින් පිටවිය පිරුණු නුවණැස

මහාඅභියෝගයෙක් විය ඔබ, බමුණු කුලපති මහන්තා වෙත
"බුද්ධගයාව බේරාගනිව්", කාහල නදින් සෙලවු දස අත
සදාචාරය මිනිස්-අයිතිය අතට පත් කළ මෙලොව සත වෙත
"බුද්ධගයා-නිදහසේ", ජයහඬ සදා පවතියි නොමැකි මෙදියත

කාහල නාදයෙ දෝංකාරය පැතිර දස අත රැව් පිළිරැව්
අදත් ගැටෙනව අපේ දෙසවන, ජාතියේ ජය කොඩිය එසවෙව්
සාමයේ මහ බලවතාණනි, එදා ඔබ මුළු ලොවම පිබිදෙව්
වෙනත් ජගතෙක් ඇත්ද? මෙදියත මහන්තල දණහිසෙන් හිටවෙව්

දැනගත යුතුයි ගුරු ගැමි ගම්පති, සැකනැහැ මේවා මට සිකුරැයි
ලක්සගණන් කලු සුද්දන් බෝකර දිනෙක සුදු උන් පිටව් යයි
මේ "මිසදිටුවන්, දැයේ සතුරන්" අපලක් මවගේ ගෙල මිරිකයි
එවුන් උතුමනි, ඔබ නොතැකුව අද, එකිනෙකා සියැතින්ම වැලලෙයි

□ කරුණා බස්නායක - **ලන්ඩනය**

## *MTV Generation*

*I Stare, focussing hard;*
*Body remaining perfectly still.*
*My ears deaf to the world,*
*All is beyond my will.*

*Drawn to a box with a vacuum-tube,*
*Helpless, like a moth to a light;*
*Through*
*which I'm lead to experience the world,*
*And perhaps to my plight.*

**Sandaruwani Abeysiri.**
**Cambridge University.**

# දයාසේන ගුණසිංහ



ගුරු වෘත්තියෙන් පුවත්පත් කලාවට බට දයාසේන ගුණසිංහයෝ කවියකු, කෙටිකතා කරුවෙකු මෙන් ම ගීත නිබන්ධකයෙකු ලෙස ද ප්‍රකට වූහ. එහෙත් ගුණසිංහයන් ගේ කීර්තිය වඩාත් ප්‍රචලිත වූයේ පුවත්පත් කලාවේදියෙකු ලෙස ය. ඩේලිනිවුස් පුවත් පත්‍රයෙහි කලා විචාරකයෙකු ලෙස ඔහු කළ මෙහෙය අතිශයින් වැදගත් වෙයි. ඩේලිනිවුස්, දිනමිණ, ජනතා සහ සිළුමිණ පුවත්පත්වල සේවය කළ ඔහු ලේක්හවුස් ආයතනයෙන් අස්වී දිවයින හා ඉරිදා දිවයින පුවත්පත්වල සමාරම්භකයෙකු විය. දිවයින ඉරිදා සංග්‍රහය ඔහු අතින් සංස්කරණය විය. පුවත්පත් කලාවේදියෙකු ලෙස ඔහු පළ කළ අදීනත්වය හා අභිමානය විස්මිත ය. වරක් රජයකට විරුද්ධ ව ඔහු විසින් ලියන ලද කතුවැකියක් හේතුවෙන් අනිවාර්යය නිවාඩු යැවීමකට පාත්‍ර විය. පුවත්පත් කලාවෙන් සමුගත් ඔහු නිර්මාණ කාර්යය සඳහා තම ජීවිතයේ සැඳෑ සමයේ වැඩි කාලයක් ගත කළේ ය. 'රන් තැටියක කඳුළු', 'නොවදිම් සිදුහත්' හා 'දොරමඬලාව' ඔහු ගේ කාව්‍ය සංග්‍රහයන් විය. කැනල් පාරේ නිශාචරයෝ ඔහු ගේ කෙටිකතා ග්‍රන්ථය විය.

දයාසේන ගුණසිංහයන් ගේ කවියෙහි ඔහුට ම උරුම වූ ගුණ සුවඳක් තිබුණු අතර රන් තැටියක කඳුළු වසරේ හොඳ ම කාව්‍ය සංග්‍රහයට හිමි රාජ්‍ය සාහිත්‍ය සම්මානය දිනාගත්තේ ය. කාව්‍යකරණයට පිවිසෙන්නට අදහස් කරන ආධුනිකයන් ඔහු ගේ කාව්‍ය ග්‍රන්ථ පරිශීලනය කිරීම වටී.

## දෑසේ නිල් පැහැය

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දීගෙන
පිඹ මොලවන විට ලිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්නෙ
දෑසේ නිල් පැහැය දැවී
සෙමෙන් තුරන් විය නොදැනිම.

නැවතත් එන බව නොකියා
හිරු අවරින් නැව් නැඟි පසු
තනිව හඬන ලොවත් සමඟ
රැයට මුහුණ ලා ඉඳගෙන
ඔබ එනතුරු මඟ බලමින්
දිවි ගණනක් ගෙවනා විට
දෑසේ නිල් පැහැය සෙමින්
අඳුරට දිය විය නොදැනිම.

බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම
මඳ සැනසිල්ලක් ලබමින්
නිදි පැදුරේ වැතිරෙන ඔබ
නඟන සුසුම් කෙඳිරිලි හඬ
හද මිරිකා හළ කඳුළට
දෑසේ නිල් පැහැ සේදී
ගලා නිමා විය නොදැනිම.

නිල් ඉඳුවර නිලේ අරුම
ඈත දියඹ නිලේ වරුණ
යොවුන් වියේ නිල් දෑසට
උවම් නැතැයි කී හිමියනි
අතීතයක් ගැන සිතමින්
මගේ දෑස දෙස නොබලා
අනාගතය දෙස යොමුවූ
දුවගෙ දෑස දෙස බලන්න.

□ දයාසේන ගුණසිංහ

## THE BLUE OF THE TWO EYES

Listening to the sound of laughter
Of the pot of rice cooking for you,
When I blow the fire aglow
To make it taste food for gods,
Scoiched, the blueness of mine eyes
Faded away imperceptibly

Seated confronting the Night
With the World sobbing in her loneliness
Because the Sun embarked from the West
With never a word about returning,
When I kept vigil awaiting your arrival home,
Living life-time upon life-time,
The blueness of my eyes
Faded gradually into the darkness.

Lying down to enjoy a brief respite
After a day's struggle to fill barns
For the two mouths you have to feed,
When you have sighs and groans
The sound squeezed my heart into tears
Washing away the blueness of my eyes, imperceptibly.

My husband dear dear, who said
The wonderful blue of the blue-lotus
The miraculous blue of the distant ocean-depths
Do not bear comparison
To the blue eyes of youth,
Do not please dwell on the past
And regard my two eyes
Instead please look on
The eyes of the daughter
Focussed on the furure

# රේල් පාර මමයි

උඩරට මැණිකේගේ
දෙපා පහස ලැබූ
සිනිඳු
සුසිනිඳු
සුමට වූ
රේල් පාර මමයි

දකිම් කොටුවේ දී
රුහුණු කුමාරිය
නෙත් කොනින් බලන
පිටුපා යන
උණුසුම් සුසුමක් දී

පීලි මාරු කර එන්නට
නොහැකි ය ඇයට
රතු ලන්තෑරුම් දැල්වී

යාල් දේවිය එයි
යාබද පීල්ලට
දක දක ම හිඳිනු මිස
පහසක් ලැබේ ද කවදා

නොකියා කිසිවක්
තේරෙන බසකින්
ලැදි ගමනින්
පසු නොබලා යන්නී
පිච්ච මල් සුවඳක්ය මැකී යන්නේ

රේලි පීලි ආත්මයෙන් මිදී
මිනිසෙකු වන්නෙමි එන භවයේ.

□ අනුර හැගොඩ
**ලන්ඩනය**

## පියකරු තැනක්

දෙවියන් ඇවිදින් පොළොවට
සොයා බලයි
ලැගුම් ගන්නට තැනක්
සුදුසු පියකරු තැනක්
දෙවොලක්?

පරමල් වේලෙන
කිරිබත් හැලී
පිළුණු ගඳ ගසන
කට්ට කුමංජල් ද ඉහිරුණු
තෙල් බේරෙන
දුම් ගඳ ගසන
දෙවොල නොරිසි වේ
දෙවියනට

අගුපිලක නිදන
මිත්තණියක් හමුවේ දෙවියනට
දරුවන් ලොකු මහත් කළ
මුනුබුරු මිනිබිරියනට
ජීවිතය දිය කළ මිත්තණියක්

කුලී වැඩකර
ලැබෙන සොච්චමෙන්
උන්ගේ කුස් පුරවාලූ
අල්ලපු ගෙදර දරුවන්වත්
කුසගින්නේ නොතැබූ
මිත්තණියක්

කාගේවත්
හව්හරණයක්
සැලකිල්ලක් නැති වුණත් අද
කාටත්
දෙස්දෙවොල් නොතියා
විඳදරා සියලු දුක්
නොසොල්මනේ ඉන්නා
මිත්තණියක්

දෙවියන් ලැගුම් ගති එහි
එයය පියකරු තැන
ඇගේ හද කුටිය

□ අරුන්දතී පලන්සූරිය

## තාත්තා

| | |
|---|---|
| දස මසක් කුස නොදරුවත් අප බිහි කරන්නට | තාත්තේ |
| දස දහස් වර තැවි තැවී ඔබ සිටින්නට ඇති | තාත්තේ |
| දස දහස් සෙනෙහසේ විකසිත මලින් සැරසුණු | තාත්තේ |
| දසදහස් වර වැටී ඔබ යා සිඹින්නෙමි මම | තාත්තේ |
| මාත් මල්ලිත් දැඩි කරන්නට නොහිමි දුක් විඳි | තාත්තේ |
| දැත් අල්ලා අකුරු කරනට අප රැගෙන ගිය | තාත්තේ |
| අපේ දිවියට සැප සදන්නට නේක දුක් විඳි | තාත්තේ |
| ඔබ හෙළූ දහඩියෙන් අප නෙත් තෙත් වුණා බුදු | තාත්තේ |
| අපේ දියුණුව සදා ලන්නට පෙරුම් පිරුවා ඔබ | එදා |
| දියුණු වූ අප දකින්නට ඔබ නොමැත මෙදියත ඔබ | මෙදා |
| සසර දික්වන එක හොඳයි අප නැවත හමුවනු ඇත | සදා |
| මාත් මල්ලිත් මවත් නිරතුරු සිහිකරන්නෙමු ඔබ | සදා |

□ සුජීව නිවුන්හැල්ල
ලන්ඩනය.

## *Little Friend of Long Ago*

*Magilene Nona, Magilene Nona*
*The little girl of long ago*
*She lived in a thatched house*
*Beside the boundless fields of corn*
*Snow white sand white sand round her house*
*Skirting her fence, the bubbling brook*

*Magilene Nona, Magilene Nona*
*I cried out loud from the fence*
*The sound wafted over the stretching fields*
*In the chilly morning air*
*I repeat and she finlly appears*
*We walk together to school*

*Some days there was the home work*
*Her house was neat and clean*
*We lay a rush mat on the floor*
*And do the arithmatic*
*She was very clever*
*My friend, Magilene Nona*

*We were only eight, I had to leave*
*Never seen or heard of her since*
*I wonder if she is alive or dead*
*Oft my thoughts creep to that bygone nook*
*I remember the fields, the bubbling brook*
*The white, white sand in her land*
*Though the memories I do treasure*
*It gives more pain than pleasure*
*It hurts as I feel my voice*
*Wafting in the wind over sand and field*
*Calling out to my child hood friend*
*Magilene Nona, Magilene Nonaa*

□ Sriya Gunasekera
London E 11

## බොහොම ස්තුතියි

ලන්ඩන් කවි සංග්‍රහය වෙනුවෙන් නොමිලයේ ප්‍රචාරය ලබා දුන් නිව්ස් ලංකා කර්තෘ වින් ප්‍රනාන්දු, වොයිස් ඔෆ් ලංකා කර්තෘ වික්ටර් ජයනෙත්ති සහ දිවයිනෙහි සුජීව නිවුන්හැල්ල මහත්වරුන්ට මෙහි නම සඳහන් නොවූ හැම දෙනාට ම **බොහොම ස්තුතියි**